Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**රාජ්‍ය නැටුම් කණ්ඩායමේ නැටුම් ශිල්පී තනතුර සඳහා**
**කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නැටුම් කණ්ඩායමේ පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත දැක්වෙන සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ අයදුම්පත් 2018.05.31 දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "නැටුම් ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත)" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම දැන්වීම www.culturaldept.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකි ය.

01. *සේවයේ නියුක්ත කරවීම සහ සේවා කොන්දේසි* :
   I. කොන්ත්‍රාත් පදනමින් පත් කරනු ලබන අතර වසර 03 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත් කෙරේ.
   II. වැටුප රු. 33,600/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

02. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :
   I. අධ්‍යාපන සුදුසුකම් :
   අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී නර්තන විෂය ඇතුළුව විෂයයන් තුන (03) කින් සමත් වීම.
   හා
   ජාතික නැටුම් මධ්‍යම හෝ අවසාන විභාගය සමත්වීම හෝ හාත්බණ්ඩේ විද්‍යා පීඨයේ නෘත්‍ය විශාරද විභාගය සමත්වීම.
   හෝ
   විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන නර්තන විෂයය සම්බන්ධව උපාධියක් ලබා තිබීම.

   II. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ
   (යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ)

   III. පළපුරුද්ද :
   රජයේ අනුමත කලායතනයක හෝ ඊට සමාන ආයතනයක නැටුම් ශිල්පියෙකු වශයෙන් වසර 05 ක පළපුරුද්ද.
   හෝ
   පාරම්පරික නර්තන ශිල්පියෙකු වීම. (ලිඛිතව සනාථ කළ යුතු ය)

   IV. කායික සුදුසුකම් :
      i. සෑම අපේක්ෂකයෙක්ම තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
      ii. උස අඩි 5 යි අඟල් 3 කට නොඅඩු විය යුතු ය.

   V. වෙනත් සුදුසුකම් :
      i. සියළුම අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
      ii. තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
      iii. නර්තන/ වාදන සියළුම අංශවල ප්‍රවීනතාවය සළකනු ලැබේ.

03. *වයස් සීමාව* : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :
- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.
- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් සහ වෘත්තීය පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ. |
| 2. අදාළ ක්ෂේත්‍ර තුළ ලබා ඇති පළපුරුද්ද (සහතික මගින් සනාථ කළ යුතුය) | 35 | |
| 3. වෘත්තීය සුදුසුකම් i. ප්‍රවීණ ශිල්පීන් යටතේ ජාතික තලයේ නිර්මාණවලට සහභාගී වී තිබීම. ii. සංස්කෘතික මධ්‍යස්ථාන මගින් හෝ ප්‍රවීණ ශිල්පීන් සමගින් විදේශ ප්‍රසංගවලට සහභාගී වී තිබීම | 25 | |
| 4. භාෂා ප්‍රවීණතාවය | 15 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

වෘත්තීය පරීක්ෂණය :

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ශිල්පීය දක්ෂතාව | 30 | 15 |
| 2. රේඛා හැඩතල සහ තාල ඥානය | 20 | 10 |
| 3. පෙනුම (උස/ මහත) | 20 | 10 |
| 4. විශේෂ කුසලතා | 20 | 10 |
| 5. න්‍යායාත්මක දැනුම | 10 | 05 |
| එකතුව | 100 | 50 |

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*
අයදුම්පත්‍ර පිරවීමේ දී අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර නිවැරදිව ඇතුළත් කළ යුතු අතර යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය

06. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

07. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත්කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

08. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

අනූෂා ගෝකුල ප්‍රනාන්දු,
අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

2018 අප්‍රේල් මස 06 වැනි දින,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
08 වන මහළ, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

*ආදර්ශ අයදුම් පත්‍රය*

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නැටුම් ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත) තනතුර සඳහා ඉල්ලුම් කිරීම

01. මුලකුරු සමඟ නම :————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
03. උපන් දිනයඃ
04. වයස (2018.05.31 දිනට) ඃ අවුරුදු :————. මාස :————. දින :————.
05. උස ඃ අඩි :————. අඟල් :————.
06. ජාතික හැඳුනුම්පත් අංකය :————.
07. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.
08. ලිපිනය ඃ
09. දුරකථන අංකය :————.
10. අධ්‍යාපන සුදුසුකම් :————.

i. අ.පො.ස. (උ./ පෙළ)
වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | ලබාගත් සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

ii. ලබාගත් උපාධිය :————.

| වලංගු වන දිනය | ක්ෂේත්‍රය | ආයතනය / විශ්ව විද්‍යාලය |
|---|---|---|
| | | |
| | | |

iii. ජාතික නැටුම් මධ්‍යම හෝ අවසාන විභාගය/ භාත්ඛණ්ඩේ විද්‍යා පීඨයේ නෘත්‍ය විශාරද විභාගය

| වලංගු වන දිනය | සමත් විභාගය | ආයතනය / විශ්ව විද්‍යාලය |
|---|---|---|
| | | |
| | | |

11. වෘත්තීය සුදුසුකම් ඃ

12. පළපුරුද්ද ඃ

මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති සියලු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවද, මෙහි සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සකු වන බවත් පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මම දනිමි.

අයදුම්කරුගේ අත්සන :————.

දිනය :————.